// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2113/5 – 2019 මාර්තු මස 05 වැනි අඟහරුවාදා – 2019.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2019 අංක 01 දරන ඌව පළාත් සභාවේ සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය අනුමත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2019.02.07 වැනි දින සම්මත කරන ලදුව 2019.02.15 වන දින ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පළ කරමි.

ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ,
ලේකම්,
ඌව පළාත් සභාව.

2019 පෙබරවාරි මස 27 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව**

2019 අංක 01 දරන ඌව පළාතේ පළාත් සභාවේ සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය

ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ පළාත් සභාවේ 2019 අංක 1 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස එය ඌව පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද දින සිට හෝ තීරණය කරන ලද දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බව ද සැළකිය යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

02. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන) ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 3 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (5) වන උපවගන්තිය, එම උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''(අ) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන රීති කිසිවක් යටතේ වූ රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල සියල්ලම හෝ ඒ අතුරින් යම් බලයක් යම් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකුට, සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුට, නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුට, සහකාර කොමසාරිස්වරයෙකුට ලියවිල්ලක් මඟින් පවරා දීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකි විය යුතුය.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ පවරා දෙනු ලබන කිසියම් බලයක් ක්‍රියාවෙහි යෙදවීමට එහි බලයලත් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයාට හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයාට හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාට හෝ සහකාර කොමසාරිස්වරයාට හෝ හැකිවිය යුතුය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම.

03. ප්‍රධාන ප්‍රඥප්තියේ (69) වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කර මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''(4) (1) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩි දුරටත් ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුවද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරුණු දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතුය. එවිට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වැනි වගන්තියේ (ඒ වගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධිවිධාන අදාල විය යුතු අතර, ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ඔහු විසින් කළ හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වැනි වගන්තිය අනුව නියම කරනු ලැබූ දඩය පැහැර හැරීමෙහිලා බන්ධනාගාරගත කිරීමේ කාලයට දණ්ඩන නියමයන් කරනු ලැබූ යම් පැහැර හරින්නෙකු ඉහත (1) උප වගන්තියේ (ඇ) ඡේදයේ නිශ්චිත සහතිකයෙහි සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.''

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

04. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

03 – 892

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.